**ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 7,215.06 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 9,139.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,924.87 ක් හෙවත් සියයට 26.68 අධිවැය වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය/ (අතිරික්තය)** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 333.29 | 315.45 | 17.84 | 5.35 |
| මූලධන | 6,881.77 | 8,824.48 | (1,942.71) | (28.23) |
| **එකතුව** | **7,215.06** | **9,139.93** | **(1,924.87)** | **(26.68)** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අදාල විෂය අංක 198011 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.00 | 0.01 | 0.03 | 0.59 | 24.00 | 22.51 |

**2.3 අග්‍රිම ගිණුම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0446/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 4.15 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ වන අංක 6000/0000/00/0012/0075/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 9.33 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අධිවැය**

198-2-3-2502 වැය විෂය යටතේ රු.මිලියන 40 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම වැය විෂය යටතේ රු.මිලියන 3,012.48 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම වැය විෂය යටතේ රු.මිලියන 2,972.48 ක අධිවැයක් වාර්තා වී තිබුණි. එම වැය විෂය යටතේ වූ රු.මිලියන 2,972.48 ක අධිවැය හේතුවෙන් එම ව්‍යාපෘතියේ අධිවැය රු.මිලියන 1,954.78 ක්ද, අදාළ වැඩසටහනෙහි අධිවැය රු.මිලියන 1,944.38 ක්ද හා ශීර්ෂයේ අධිවැය රු.මිලියන 1,924.88 ක් ඇති වීම කෙරෙහි බලපා තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 19801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,769,920 ක්වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශය යටතේ ආයතන 04 ක් ස්ථාපිත කර තිබුණද, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණක හා ඉංජිනේරු සහකාරවරු දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ කාර්යභාරය සමග සැසඳීමේදී අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අනුයුක්ත කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. 2015 වර්ෂයේදී අමාත්‍යාංශයට අදාළව අභ්‍යන්තර විගණන විමසුම් කිසිවක් නිකුත් කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ රු.38,956,243 ක්වූ බැරකම් පැවැතුණි. එම බැරකම් පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 264 | 4,011,054,982 | මුදල් ගෙවූ බවට කොන්ත්‍රාත්කාර සමාගම විසින් මුද්දර යෙදූ කුවිතාන්සියකින් සනාථ කර නොතිබුණි. |

**(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2007අප්‍රේල් 33 දිනැති අංක 05 දරන හා 2007 (1)33 දිනැති අංක 20 දෙසැම්බර් දරන චක්‍රලේඛ | - | නිශ්චිත සුදුසුකම් සපුරා නොමැති ජොෂ්ඨ නිලධාරින් තිදෙනෙකු දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයට බඳවාගෙන තිබුණි . |

## 3.6 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 14,617 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1,842 ක් උපයෝජනය කර තිබුණි. මීට අමතරව 2013 වර්ෂයේදී අවසන් කළ යුතුවූ ව්‍යාපෘතියක්ද අමාත්‍යාංශය සතුව තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය**

විදේශාධාර ව්‍යාපෘතිවල මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ගංවතුර හා නායයාම් නිසා සිදුවිය හැකි ප්‍රවාහන අපහසුතා මගහැරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තර්ජනයට ලක්වූ බෑවුම් ස්ථායීකරණය සඳහා වැඩසටහන් 07 ක් සහ ගං වතුර තත්ත්වයන්ට හේතුවන පාලම් සහ බෝක්කු 12 ක් වැඩි දියුණු කිරිම සඳහා වැඩසටහන් 09 ක් හඳුනාගෙන ලබාදුන් කොන්ත්‍රාත් අතරින් නැදිමාලේ - බොරලැස්ගමුව පාලම ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.

(ii) ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනවලින් තෝරාගත් 05 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද ප්‍රමාණාත්මක අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(iii) දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ වාරක පරීක්ෂණය අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- තිස්ස වැව හා යෝධ වැව ව්‍යාපෘතියට අයත් බෙදා හැරීම් ඇළක පැති බැම්ම ජල කාන්දු වීමක් සහිතව පැවති අතර එම බෙදා හැරීම් ඇළට ඉහළින් ඉදිකර තිබුණු කෙත් ඇළෙහිද ජල කාන්දු වීමක් තිබුණි. තවද ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් 20 ක් හඳුනාගෙන තිබුණද ඉදිකිරීම් 16 ක් නිමකර නොතිබුණි.
- ව්‍යාපෘතිය යටතේ වීරකැටිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් ඉදිකිරීම් 25 කින් සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් 16 ක් නිමකර නොතිබුණි.

(ආ) **නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපෘතිය**

**------------------------------------------------------------------------**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු විය.

**(i) විදේශීය ව්‍යාපෘති ඇවර කිරිම**

**---------------------------------**

විදේශිය ව්‍යාපෘති නිම කර ඇවර කිරීමේ කටයුතු සිදු කළ යුතු වුවද, 2013 ඔක්තෝබර් 22 දින අවසන් කරන ලද ඉහත සඳහන් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ව්‍යාපෘතිය ඇවර කිරීමේ සැලැස්ම 2015 මැයි 31 දින දක්වා පිළියෙල කර නොතිබුණි. කෙසේ වෙතත් 2013 ජුලි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ව්‍යාපෘතිය විසින් රු.25,420,885 ක වැය කර තිබුණි.
- ව්‍යාපෘතිය නිමකිරීමේදී රු.484,877,148 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ, රසායනාගාර සහ මිණුම් උපකරණ ආදී වත්කම් විවිධ රාජ්‍ය නියෝජිත ආයතනවලට භාරදී තිබුණි. කෙසේ වෙතත් එම වත්කම් අදාළ රාජ්‍ය ආයතන විසින් භාරගත් බවට තහවුරු කෙරෙන වත්කම් භාරගැනීමේ ලැයිස්තු, වාහන ලියාපදිංචි කිරීමේ පොත් ආදී ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
- විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු අනුව, මෝටර් වාහන 23 ක් රාජ්‍ය නියෝජිත ආයතන අතර බෙදාහැර තිබුණි. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කරන ලද ලැයිස්තුවෙහි එකී වාහන අන්තර්ගත වී නොතිබුණි.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රඹෑව වැඩපල වෙත යතුරු පැදි 46 ක් භාරදී තිබුණු නමුත් එම යතුරු පැදි භාරදීමට අදාළ හේතු පැහැදිළි කර නොතිබුණි.
- ව්‍යාපෘතිය විසින් කරන ලද බෙදාහැරීමේ ලැයිස්තුවල වටනාකම් නොදැක්වුනු හෙයින් රාජ්‍ය නියෝජිත ආයතන අතර බෙදාහරින ලද ස්ථාවර වත්කම්, මූල්‍ය ප්‍රකාශන සමග සැසැදීමට නොහැකි විය.
- ව්‍යාපෘති කාර්යයන් යටතට නොගැනෙන මහවැලි අධිකාරියේ නිරාවිය ගොවිපොළට ෆුසෝ කැබ් රථයක් සහ ශීතකරණයකින් හා වැසියකින් සමන්විත කිරි නිෂ්පාදන ඒකකයක් වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 7.30 ක් හා රු.මිලියන 15.67 ක් වැය කර තිබුණි.

**3.7 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**-------------------------------------------------**

ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත බෙදා හැරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් පෙරසවි ගොඩනැගිලි මිලදී ගෙන වාරික 07 කින් ගෙවීම සඳහා 2012 ජුලි 05 දින වීන සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2015 වර්ෂයේදී රු. මිලියන 2,774.80 ක් ගෙවා තිබුණු අතර 2012 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. මිලියන 11,351.39 ක් ගෙවා තිබුණි. එම පෙරසවි ගොඩනැගිලි මිලදී ගැනීම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යභාරයක් නොවන අතර අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්මේද ඇතුළත්වී නොතිබුණි. තවද ත්‍රිවිධ හමුදාව හා

පොලීසිය වෙත භාරදුන් මුලු නිවාස සංඛ්‍යාව සහ එම නිවාස සතුටුදායක ලෙස සවිකළ බවට ආයතන ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකද 2015 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) **ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේදී රු. මිලියන 998.58 ක්ද, 2015 වර්ෂයේදී රු. මිලියන 3,012.48 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 4,011.06 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization advance) වශයෙන් විදේශීය සමාගමකට ගෙවා තිබුණි. එම මුදලින් රු. මිලියන 1,038.58 ක් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසා තිබුණද, රු. මිලියන 2,972.48 ක් ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 සැප්තැම්බර් 04 දිනැති අංක BD/EE/144/09/21 දරන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදී ගෙවා තිබුණු රු. මිලියන 3,012.48 ක අත්තිකාරම් මුදල පියවීම සඳහා අමතර ප්‍රතිපාදන ලබාදිය නොහැකි බවත් ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදු නොකළ යුතු බවත්, 2015 වර්ෂයේදී සලසා තිබුණු ප්‍රතිපාදය රු. මිලියන 40.00 ක් වී තිබුණත්, එම සීමාව ඉක්මවා රු.මිලියන 2,972.48 ක් වැය කර තිබුණි.

(ii) අග්‍රාමාත්‍ය ලේකම් සහ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී අමතන ලද 2016 පෙබරවාරි 13 දිනැති සහ 2016 මාර්තු 14 දිනැති අංක MI/IRRIDEV/02/20/GNDP දරන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි ප්‍රකාරව වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ක අත්තිකාරම් ගෙවීමට අමාත්‍යාංශය එකගවූ බව අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් මුදල වූ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 690.00 කින් සියයට 5 ක්වූ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 34.50 ක් වැඩ ආරම්භ කිරීමට ප්‍රථම කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවිය යුතුව තිබුණි. එපරිදි ගෙවීම් කිරීමට කටයුතු නොකර 2014 දෙසැම්බර් 30 දින ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 7.51 (රු. මිලියන 998.58) ක්ද, 2015 ජනවාරි 06 දින ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 7.49 (රු. මිලියන 1,000.14) ක්ද, 2015 ජනවාරි 07 දින ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 14.99 (රු. මිලියන 2,009.34) ක්ද වශයෙන් එකතුව ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 29.99 (රු. මිලියන 4,011.05) ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. එම ගෙවීම් කිරීමට අදාළ හේතුව කුමක්ද යන්න විගණනයට අනාවරණය නොවුණි.

(iii) වැඩ ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ලෙස ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 34.50 ක අත්තිකාරම් ගෙවා අවසන් වන විටත් කොන්ත්‍රාත් සමාගමට වැඩ ආරම්භ කිරීමට හැකියාවක් නොතිබුණි. 2015 ජනවාරි 08 දින වන විට ගෙවිය යුතු ව තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන

4.51 ක් අඩුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් අත්තිකාරම් මුදල් ගෙවීම හේතුවෙන් වර්ෂ 1 ½ කට අධික කාලයක් මුළුල්ලේ කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව විදේශීය සමාගමකට රජයේ උපයෝජනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි.

(iv) පැවති ස්ථාවර තැන්පත් පොලී අනුපාතය සියයට 10 ක් ලෙස ගතහොත් කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවා ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ස්ථාවර තැන්පත් ගිණුමක වර්ෂ 1½ ක් ආයෝජනය කරන ලද්දේනම් රු. මිලියන 601.66 ක පොලී ආදායමක් ඉපයිමට හැකියාව තිබුණි. එබැවින් ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 601.66 ක මුල්‍යමය අවාසියක් සිදුවී තිබුණි. ගෙවා තිබෙන මුදල සහ මුලු කාලය තුළ මුදලේ අගය අඩුවීමේ ප්‍රමාණයද ගණන් බලා ඊට අදාළ පොලියද සමග මුලු මුදල ආපසු අයකර ගැනීමට සහ ඒකාබද්ධ අරමුදලට සිදු කරන ලද අලාභය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ට එරෙහිව කටයුතු කිරීමට අදාළ ක්‍රියාමාර්ග 2016 අගෝස්තු 09 දින වන විටත් ගෙන නොතිබුණි.

(v) 2014 සහ 2015 යන වර්ෂවල අවස්ථා තුනකදී කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවා තිබුණු රු.මිලියන 4,011.05 ක අත්තිකාරම් එම සමාගම විසින් ලබා ගත් බව අදාළ මුද්දර ගාස්තු ගෙවූ කුවිතාන්සි පතක් කර නොතිබුණි.

(vi) 2015 දෙසැම්බර් 02 දිනැති අංක MI/IRRI.Dev/02/2015/ GNDP දරන අමාත්‍යාංශ ලේකම්ගේ සහ කොන්ත්‍රාත් සමාගම අමතන ලද ලිපිය ප්‍රකාරව ගෙවා තිබෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල ආපසු ලබාදෙන ලෙස ඉල්ලා තිබුණද, 2016 අගෝස්තු 09 දින වන විටත් එම මුදල අමාත්‍යාංශය වෙත ලබා ගෙන නොතිබුණි.

(vii) 2015 ඔක්තෝබර් 26 දිනැති අංක DMA/IA/2015/41 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය සහ මහවැලි හා 2015 දෙසැම්බර් 11 දිනැති අංක රහිත පරිසර අමාත්‍යාංශය ලේකම්ගේ ලිපිය ප්‍රකාරව ලබාගෙන ඇති බැංකු ඇපකරයේ වලංගු කාලය අවසන් විමට පෙර එනම් 2017 දෙසැම්බර් 09 දිනට පෙර ගෙවා ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් සහ ඊට අදාළ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 02 | 02 |
| **(ii)** | තෘතියික මට්ටම | 13 | 07 | 06 |
| **(iii)** | ද්විතීයික මට්ටම | 40 | 31 | 09 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 30 | 19 | 11 |
| | **එකතුව** | **87** | **59** | **28** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට 28 ක සේවක පුරප්පාඩුවක් තිබියදී 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණද එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතිම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්යමණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදී නිරික්ෂණය විය.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ගෙන් අවිධිමත් ලෙස ලබාගෙන තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | ලබාගෙන තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | රියදුරු | 01 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2015 ජූනි 29 සිට මේ දක්වා |
| (ii) | කම්කරු | 01 | ජල සම්පත් මණ්ඩලය | 2015 සැප්තැම්බර් 09 සිට මේ දක්වා |
| (iii) | කම්කරු | 01 | ජල සම්පත් මණ්ඩලය | 2016 ජනවාරි 27 සිට 2016 ජූනි 21 දක්වා |
| (iv) | කාර්යාල සහායක (අනියම්) | 01 | ජල සම්පත් මණ්ඩලය | 2015 සැප්තැම්බර් 22 සිට මේ දක්වා |
| (v) | කාර්යාල සහායක (කොන්ත්‍රාත්) | 01 | ජල සම්පත් මණ්ඩලය | 2015 නොවැම්බර් 13 සිට 2015 දෙසැම්බර් 02 දක්වා |
| (vi) | කාර්යාල සහායක | 01 | ජල සම්පත් මණ්ඩලය | 2016 පෙබරවාරි 11 සිට 2016 මාර්තු 11 දක්වා |
| (vii) | කළමනාකරු (පාලන) කොන්ත්‍රාත් | 01 | ජල සම්පත් මණ්ඩලය | 2015 ජූනි 18 සිට මේ දක්වා |

අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා අනුමැතියකින් තොරව යොදවාගෙන තිබුණු රියදුරුගේ වැටුප සහ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.197,340 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවා තිබුණු අතර කම්කරුවන්, කාර්යාල සහයකයින් සහ කළමනාකරුගේ වැටුප් සහ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.437,444 ක් ජල සම්පත් මණ්ඩලයෙන් ගෙවා තිබුණි.